# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2140/44 - 2019 සැප්තැම්බර් මස 11 වැනි බදාදා - 2019.09.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : BKP/LAND/ACQUI/D2/1/3.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/15/2016/VE/426.

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2016 නාය යාමෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම කිරිපෝරුව II කොටස නැමැති ඉඩම අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අත්පත් කර ගැනීමට රජය අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියේ (I) වන උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිපෝරුව ග්‍රාම නිලධාරී වසමේ කිරිපෝරුව ගම තුළ පිහිටි කෑගල්ල මැනුම් අධිකාරියේ අංක මු.පි.කෑ. 3679 දරන මූලික පිඹුරේ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 6, 7 (02) ක් වේ.

**කැබලි අංක: 01, 02, 03, 04, 05, 06**

ඉඩමේ නම: කිරිපෝරුව II කොටස; හිමිකම් පාන්නන්ගේ නම සහ ලිපිනය: 01. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල. 02. කළමණාකරන අධ්‍යක්ෂ, කෑගලු වැවිලි සමාගම, අංක 310, හයිලෙවල් පාර, මහරගම. 03. වැවිලි කර්මාන්ත අමාත්‍යංශය, දෙවන මහල, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්ටයාර 1.8729.

***වන්දි හිමිකම් පරීක්ෂණ දිනය :***

මු.පි.කෑ. 3679 පිඹුරේ කැ. අංක 06, 07 සඳහා 2019.10.15 වැනි දින පෙ.ව. 10.00 ට.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ


1A - G 30970 - 22 (2019/09)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ඉහත සඳහන් දිනයන්හි හා වෙලාවන්හිදි බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තව ද 2019.10.05 දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජේ. එම්. රම්‍යා ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්පත් කර ගැනීමේ නිළධාරී,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බුලත්කොහුපිටිය.

2019 සැප්තැම්බර් මස 04 වැනි දින,
බුලත්කොහුපිටිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල යේ දී.

09 - 860